# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2375/15 – 2024 මාර්තු මස 12 වැනි අඟහරුවාදා – 2024.03.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ නියමය

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්ද වූ ද, අංක 414/10 හා 1986.08.13 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දවූ ද, 1986 අංක 350 හා 1986.07.29 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. පහත විස්තර වන එම ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත, එබැවින්, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 414/10 හා 1986.08.13 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 1986 අංක 350 හා 1986.07.29 වැනි දින දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 03J/80/LG/773.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කතර/3/2/එල්ජී/227
2024 පෙබරවාරි මස 07 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, තණමල්විල උප දිසාපති කොට්ඨාසයේ, බුත්තල කෝරළේ සුළු කොට්ඨාසයේ, කතරගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අවසාන හුලක්ෂණාත්මක පිඹුර 25හි අතිරේක අංක 40 හා 1993.04.08 දිනැති පිඹුරෙහි පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම් :

01. **කැබලි අංක 2064 – නිකගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.313**

උතුරට: 1R (මහා මාර්ගය) 2065; නැගෙනහිරට: 2065 1R; දකුණට සහ බටහිරට: 1R (ගම් සහා මාර්ගය).

02. **කැබලි අංක 2065 – පැපොල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.124**

උතුරට: 1R (මහා මාර්ගය); නැගෙනහිරට: 1R; දකුණට: 1R 2064; සහ බටහිරට: 2064.

03. **කැබලි අංක 2066 – තේක්කගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.149**

උතුරට: 1R (මහා මාර්ගය); නැගෙනහිරට, දකුණට සහ බටහිරට: 1R.

EOG - 03 - 0102


1A – G 041577 – 09 (2024/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*